**www.wsws.org**

**ලෝක සමාජවාදී වෙබ් අඩවිය**

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බෙදීම් වැඩි වෙත්ම යුරෝපීය ආර්ථිකය බෙලහීන වෙයි

**European economy falters as divisions mount**

**ස්ටෙෆාන් ස්ටේන්බර්ග් විසිනි**

**2010 සැප්තම්බර් 27**

යුරෝ කලාපයට අයත් රටවල් 16යේ ආර්ථික ක්‍රියාකාරීත්වයේ නිශ්චිත කඩා වැටීමක් සිදුව ඇති බව ප්‍රමුඛ පෙලේ ආර්ථික ආයතන විසින් නිකුත් කල අලුත්ම සංඛ්‍යා මගින් පෙන්නුම් කරයි.

ආර්ථික වර්ධනය පිලිබඳ ප්‍රධාන දර්ශකයක් වන, ගැනුම් කලමනාකරුවන්ගේ දර්ශකයට අනුව යුරෝ කලාපය තුල ආවරනිත නිෂ්පාදන හා සේවා අංශයන්, පෙබරවාරි මාසයේ පටන් එහි පහලම අගය සනිටුහන් කරමින්, අගෝස්තු මාසයේ 56.2 සිට සැප්තැම්බර් මාසයේ 53.2ට කඩා වැටුනි.

මේ අතර ලක්සම්බර්ග්හි යුරෝපීය සංගමයේ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව නිවේදනය කලේ, පසුගිය මාසයට සාපේක්ෂව ජූලි මාසයේ දී කාර්මික ඇනවුම් සියයට 2.4කින් අඩුවී ඇති බවයි.

විශ්ලේෂකයන් සලකන්නේ, සැප්තැම්බර් මාසයේ දී පහත වැටුන ගැනුම් කලමනාකරුවන්ගේ දර්ශක අගය, මෙම වසරේ ඉදිරි මාසවලදී ද යුරෝපීය ආර්ථිකයේ බෙලහීනත්වය දිගටම පවතින බවට දෙස් දෙන සලකුනක් ලෙසිනි.

නවතම සංඛ්‍යා ලේඛන නිකුත් වූයේ, යුරෝපා ආර්ථිකයේ යම් පුනර්ජීවනයක් පෙන්නුම් කල, 2011 වර්ෂයේ දෙවන කාර්තුවේ දත්ත ප්‍රකාශයට පත්කිරීමෙන් අනතුරුවය. දෙවන කාර්තුවෙහි සිදු වූ අනපේක්ෂිත ආර්ථික වර්ධනය දහනය කලේ, බොහෝ දුරට අපනයන කර්මාන්තයේ ගතිකය හේතුකොටගෙන ජර්මනිය සිය ආර්ථික වර්ධනයේ සියයට 2.2 ක නැගීමක් වාර්තා කිරීමෙන් පසුවය.

යුරෝපීය නායකයන් සහ මාධ්‍ය ආයතනවල පුලුල් කොටස් වර්ධනයේ මෙම සංඛ්‍යාවන් සාදරයෙන් වැලඳගත්තේ, 2008 වර්ෂයේ සිට දෙ වසරක් තිස්සේ යුරෝපය මුහුන පා සිටින ආර්ථික අර්බුදයෙන් ගොඩඑමින් තිබෙන බවට සලකුනක් ලෙස එය සලකමිනි.

කෙසේ වෙතත් දැන්, පසුගිය මාසයේ පැවැත් වූ තුරුගොස කෙමෙන් පහව ගොස් ඇති අතර දෙවන කාර්තුවෙහි ඉදිරිපත් කරන ලද දත්ත තාවකාලික "තාක්ෂනික නිවැරදි කිරීමක්" වශයෙන් ප්‍රකාශකොට ඇත.

ආර්ථික විශ්ලේෂක ක්‍රිස් ස්කික්ලුනා නවතම දත්ත පිලිබඳව අදහස් දක්වමින් සඳහන් කලේ, "මෙම වර්ෂය ආරම්භයේ දී ප්‍රධාන පෙලේ කාර්මික රටවල යම් ආර්ථික පිබිදීමක් පෙන්නුම් කල නමුත් දැන් අපට පෙනී යන්නේ, එය තිරසාර නොවන බවයි. වර්ධනයට තුඩු දෙන සැබෑ යාන්ත්‍රනයක් නොමැති අතර මෙම අර්බුදයේ හානිකර විපාක අප අත්දකිමින් සිටින්නෙමු" යනුවෙනි.

විශේෂයෙන්ම ගැනුම් කලමනාකරුවන්ගේ දර්ශකය හා යුරෝපීය කාර්මික ඇනවුම්වල වැටීම මගින් අනාවරනය වන්නේ යුරෝපයේ වඩා ශක්තිමත් ආර්ථිකයන් සමස්තයක් ලෙස ලෝක ආර්ථිකය මත රඳා පවතින තරමයි. චීනයේ සහ ආසියානු කොටි ආර්ථිකයන්හි වර්ධනයේ පහත වැටීමක් සමඟ අත්වැල් බැඳගෙන එක්සත් ජනපද ආර්ථිකය දීර්ඝ කාලපරිච්ඡේදයක් එකතැන පල්වීම පිලිබඳ වැඩෙන බිය ප්‍රධාන යුරෝපීය බලවතුන් සඳහා රිනාත්මක ප්‍රතිවිපාක ජනනය කර තිබේ.

ඩොයිෂෙ බැංකුවේ යුරෝපීය ආර්ථික විශේෂඥ ගිල්ස් මොඑක් සඳහන් කලේ, "ඇමරිකාව සහ චීනය වැනි රටවල ඉල්ලුමෙහි ඉහල පහලයෑම් පිලිබඳව ජර්මනිය අතිශයින්ම සංවේදී වන අතර, ප්‍රන්සය අතුරු විපාකවලින් පීඩාවට පත් වෙනු ඇත" යනුවෙනි.

විශේෂයෙන්ම ජර්මනියට අනතුරු අඟවමින් මොඑක් නිගමනය කරන්නේ, තමන්ගේම ක්‍රමවලින් කිසිදු රටකට මෙම අර්බුදයෙන් ගොඩ ආ නොහැකි බවය. "මෙම සියලු කතන්දරවල තේරුම, 'විසංඳීමක්' (ඩීකපලින්) වැනි දෙයක් ඇත්තේ නැති බවයි."

යුරෝ කලාපයට පිටතින් ඇති ප්‍රධාන පෙලේ

රටවල් ද රිනාත්මක සංඛ්‍යා වාර්තා කොට ඇත. මහා බ්‍රිතාන්‍යයේ උද්ධමනය අඛන්ඩව ඉහල නැගෙන අතර ශුද්ධ පාරිභෝගික නය, උකස් අනුමත කිරීම් සහ සමාගම් වලට ලබාදුන් බැංකු නය අගෝස්තු මාසයේදී කඩා වැටී ඇති බව බ්‍රිතාන්‍ය බැංකුකරුවන්ගේ සංගමය නිවේදනය කලේය.

පර්යන්ත යුරෝපීය රටවල් ගනනාවක් ලබා ගත් නය යලි පියවීමේ ශක්‍යතාව මෙන්ම, දරුනු කප්පාදු වැඩපිලිවෙලවල් ක්‍රියාත්මක කිරීම සඳහා ඒවාට ඇති හැකියාව පිලිබඳ කනස්සල්ල ද යුරෝ කලාපීය ආර්ථිකයේ සංඛ්‍යා මගින් පෙන්නුම් කරන දුර්වලකම් සමග එකට බැඳී තිබේ.

පසුගිය 23ද ඩබ්ලින් නුවරදී නිකුත් කරන ලද දත්ත අනාවරනය කලේ, අයර්ලන්තයේ දල ජාතික නිෂ්පාදිතයේ (දදේනි) අගය පූර්ව කාර්තුවට සාපේක්ෂව ජූනි මාසයෙන් අවසන් කාර්තුව සඳහා සියයට 1.2කින් හැකිලී ගිය බවයි. මේ හේතුවෙන් රට යලිවතාවක් පූර්න ආර්ථික අවපාතයකට වැටීමේ බිය මතුවෙමින් තිබේ. ඊට ප්‍රතිචාර වසයෙන් ආයෝජකයෝ, අවුරුදු අයර්ලන්ත බැඳුම්කරවල පොලිය සියයට 5ටත් එහාට තල්ලු කරමින් ආන්ඩුවේ නයකර විකුනා දැමීමට පටන් ගත්හ.

සාමාන්‍යයෙන් අයර්ලන්තය බටහිර යුරෝපයේ වඩාත්ම කුරිරු කප්පාදු වැඩසටහන් ක්‍රියාවට නැගූ රට ලෙස ප්‍රසංසාවට ලක්විය. එහෙත් රටේ බැංකු සහ මූල්‍ය වෙලඳපොල මත අභිනවයෙන් යෙදෙන පීඩනය හමුවේ ආන්ඩුව, තවත් දුරදිග යන අයවැය කප්පාදුවලට යායුතු බව අයර්ලන්ත මහබැංකු අධිපති පසුගිය සතියේදී ප්‍රකාශ කලේය.

පෘතුගාලයේ දස අවුරුදු බැඳුම්කරවල පොලිය තියුනු ලෙස ඉහල නංවමින් අයර්ලන්තයේ සංඛ්‍යාලේඛන පෙරලා යුරෝපයේ වඩා දුබල රටවල් හරහා කම්පන තරංග නිකුත් කලේය.

යුරෝ කලාපයේ තෙවන විශාලතම අයවැය හිඟය සහිත ස්පාඤ්ඤයේ මුදල් ඇමති එලීනා සල්ගාදු, එය අවම කිරීමේ වැයමක් ලෙස නව කප්පාදු පියවර නිවේදනය කලාය. සියයට අටකින් රාජ්‍ය වියදම් කපා දැමීමට ආන්ඩුව තීන්දු කර ඇති බව සල්ගාදු සඳහන් කලාය.

සියලුම විශ්‍රාම වැටුප් කැටිකිරීමක් ද ආන්ඩුවේ අමාත්‍යංශ ඒවායේ අයවැය සියයට 16කින් අඩු කලයුතු බවට ද නියෝග පනවා තිබේ. නව අයවැයේ එල්ලය වන්නේ රටේ අයවැය හිඟය දල ජාතික නිෂ්පාදිතයෙන් සියයට 6ක මට්ටමට අඩු කිරීමයි. මෙය වුවත් යුරෝපීය සංගමය විසින් පනවා ඇති සීමාව මෙන් දෙගුනයක ප්‍රමානයකි.

කප්පාදු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සහන නොදීම පිලිබඳ මූල්‍යමය ප්‍රභූවේ උත්සුකතා අවධාරනය කරමින් එක් ප්‍රමුඛ මූල්‍ය විශ්ලේෂකයෙකු සඳහන් කලේ, "වෙලඳපොලවල් විසින් ප්‍රත්‍යන්ත ආර්ථිකයන් අත්තකිලමථානුවෙන් සියලු දුක් විඳදරා ගැනීමක් බලාපොරොත්තු වෙයි. .... කප්පාදු පිලිබඳව මෙම වසරේ මුලදී අපට දැකගත හැකිවූ උද්යෝගය දැන් දකින්නට ඇත්තේ නැත." යනුවෙනි.

එලඹෙන වසරේදී ස්පාඤ්ඤ ආර්ථිකය 1.3ක ප්‍රතිශතයකින් පුලුල් වනු ඇතැයි යන අනාවැකිය පිලිබඳව තමන් බලාපොරොත්තු තබා සිටින බව සල්ගාදු ප්‍රකාශ කලාය. සැබවින්ම මෙම සංඛ්‍යාව විශේෂඥයින් විසින් සලකනු ලබන්නේ මුලුමනින්ම අයථාර්ථවත් එකක් බව හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අනාවැකි පලකල වර්ධනය මෙන් දෙගුනයක් බවත්ය. තත්වය පිලිබඳව අයෝජකයන්ගේ තැවුල පිලිබිඹු කරමින් ස්පාඤ්ඤය හා ජර්මනිය අතර දස අවුරුදු බැඳුම්කර අතර ව්‍යාප්තිය වසරකට ඉහතදී පැවති මට්ටම මෙන් දෙගුනයක මට්ටමට ලඟාවී තිබේ.

ප්‍රත්‍යන්ත යුරෝපීය රටවලට ඔවුන් ලබාගත් නය යලි පියවීමේ ශක්‍යතාව පිලිබඳව ආයෝජකයන්ගේ උත්සුකතාවන් සමන්විත වන්නේ පහත සඳහන් කරුනෙනි. එනම්, 2008 වසරේ මූල්‍ය අර්බුදය මධ්‍යයේ පැන නැගි හිඟයන් පියවා ගැනීම පිනිස තමන්ගේ ප්‍රාග්ධනය පෙරනුවූවිරූ මට්ටමකින් ඉහල නංවා ගැනීමට යුරෝපානු බැංකුවලට අවශ්‍යව තිබීමේ කරුනෙනි. 2010 සහ 2011 වර්ෂවලදී යුරෝ කලාපයේ බැංකු විසින් ගෙවීමට නියමිතව ඇති නය ප්‍රමානය ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 1ග7 ක් ලෙසට ඇස්තමේන්තුකොට ඇත. උක්ත ප්‍රකාශිත අගය එක්සත් ජනපද, මහා බ්‍රිතාන්‍ය හා අනෙකුත් බැංකුවල නයට වඩා බෙහෙවින් විශාල ප්‍රමානයකි.

දැඩි පීඩාවට ලක්ව තිබෙන යුරෝපා ආර්ථිකය නමැති උමං මගේ දැකිය හැකි එකම ආලෝක ධාරාව, ජර්මනියේ ධනාත්මක ආර්ථික දත්ත පමනි. ජර්මානු කලමනාකරුවන්ගේ මෑතම මත විමසුමකදී ව්‍යාපාර පිලිබඳ විස්වාසයේ වැඩීමක් සලකුනු කල අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, මෙම වසරේ ජර්මනියේ

වර්ධනය සඳහා වන සිය පුරෝකථනය සියයට තුනක් දක්වා ඉහල නැංවීය.

එහෙත් ජර්මනිය, නියාමයෙන් බැහැර සුවිශේෂයක් සේ තවමත් පවතී. මහාද්වීපය හරහා ආර්ථික හා සමාජයීය වෙනස්කම් පුලුල් වෙමින් පවතින තතු හමුවේ යුරෝපීය ව්‍යාපෘතියේ අනාගත අන්තරායන් විචාරකයන් බොහොමයක් දෙනාගේ අවධානයට ලක්ව තිබේ.

ඉදිරියේ එලැඹෙන සති හා මාසවලදී, ඉහල නංවන බදු ද සමඟ සමාජ සුභසාධන පිරිවැය, විශ්‍රාම වැටුප් සහ වැටුප් කප්පාදු, තවදුරටත් දේශීය පරිභෝජනයේ ගෙල මිරිකමින් හා ආර්ථික වර්ධනය මන්දගාමී කරමින් යුරෝපයේ බොහෝ ප්‍රදේශවල ක්‍රියාත්මක වනු ඇත.

© www.wsws.org